දිවි තොර කරගැනීම් යනු වර්තමානයේදී සැලකිල්ලට ලක් විය යුතු ප්‍රමාණයේ සමාජ ගැටළුවකි. ශ්‍රී ලංකා පොලිසියේ සංඛ්‍යාලේඛන අනුව, 2020 වසර තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ දිවි තොර කරගැනීම් ප්‍රමාණය 3,074 ක් වේ. එනම්, ශ්‍රී ලංකාව තුළ දිනකට දිවි තොර කරගැනීම් සාමාන්‍යය 8.4 ක් වේ.

මෙම තත්වය යටතේදී දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍ය මගින් විශේෂ ප්‍රවේසමක් සහ මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීමක් අවශ්‍ය වේ. විශේෂයෙන්ම වැඩි අවධානයක් එල්ල වන ඝාතන-දිවි තොර කරගැනීම් සිදුවීම් වලදී මේ පිළිබඳ වැඩි අවධානයක් අවශ්‍ය වේ.

එවැනි පුවත් වාර්තාවන්හි දිවි තොර කරගත් ආකාරය දැක්විය යුතු නොවේ. මන්දයත්, තවත් අයෙකු එය අනුකරණය කිරීමේ හැකියාවක් තිබෙනා බැවිනි. එසේම, මෙවැනි පුවත් වාර්තාවන් හා උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබීමට හැක.

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Samaritans_Media...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://www.police.lk/index.php/item/138

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Dinamina #Mawbima**